Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ශිල්ප කලා

සතිය- 11

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## පුනරීක්ෂණ අභ්‍යාස

නිපුණතාවය - 06. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය

නිපුණතා මට්ටම - 6.1 කැබලි රෙදි ආශ්‍රිත නිර්මාණ කරයි.

කාලච්ඡේද - 06

- **දී ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1) රෙදි කැබලි ඇසුරෙන් කළ හැකි නිර්මාණයක් ලෙස රෙදි බෝනික්කා තැනීමේදී විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ කුමක් පිළිබඳව ද?
   1. නිර්මාණය සඳහා යොදා ගනු ලබන රෙදි වර්ගය පිළිබඳව ය.
   2. පතරොම සැකසුම් කිරීම පිළිබඳව ය.
   3. එහි දිග, පළල හා උස පිළිබඳව ය.
   4. ඒ සඳහා යොදන මැහුම් ක්‍රම පිළිබඳව ය.

2) ස්වයං රැකියාවක් ලෙසත්, විනෝදාංශයක් ලෙසත් සුරතල් සතුන් හා සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය වර්තමානයේ ඉතා ජනප්‍රිය වී ඇත. මෙහිදී පිරවුම් මාධ්‍ය ලෙස වඩාත් යෝග්‍ය වන්නේ,
   1. රෙදි කැබලි හා පුළුන් ය.
   2. රෙදි කැබලි හා පැඩින් ය.
   3. පුළුන් හා පැඩින් ය.
   4. පැඩින් හා පැඩින් ය

3) සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණයේදී ඒ සඳහා වූ විශේෂිත රෙදි වර්ග භාවිතා කරයි. ඒ අතුරින් බහුලවම භාවිතා කරනු ලබන රෙදි වර්ගය වනුයේ,
   1. ෆෙල්ට් ය.
   2. වෙල්වට් ය.
   3. පෝජට් ය.
   4. කාපට්ය

4) විසිතුරු සෙල්ලම් බඩු නිර්මාණයේදී මූලිකවම ඒ සඳහා පතරොම සකස් කර ගත යුතු ය. ඒ අනුව අවශ්‍ය කොටස් කපා ගනු ලබයි. ටෙඩි බෙයාර් නිර්මාණය සඳහා කපා ගත යුතු කොටස් ගණන වන්නේ,
   1. 9 කි.
   2. 10 කි.
   3. 12 කි.
   4. 14 කි.

5) රෙදි කැබලි ආශ්‍රයෙන් ටෙඩී බෙයාර් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

A - පතරොම කැමති ප්‍රමාණයකට විශාල කර ගැනීම.

B - පතරොම කපා ගැනීම.

C - පතරොම රෙද්දේ තබා ඇඳ ගැනීම.

D - රෙදි කොටස් කපා ගැනීම.

1. A, B, C, D    2. B, A, C, D    3. C, D, B, A    4. D, C, A, B

6) ටෙඩී බෙයාර් ඉතා ජනප්‍රිය සැහැල්ලු සෙල්ලම් සතෙකි. එය ලොවට නිර්මාණය වී ටෙඩී බෙයාර් යන නම ලැබුණේ,

1. ඇමරිකාවේ ජනාධිපතිවරයෙකු නිසා ය.
2. ඇමරිකාවේ අගමැතිවරයෙකු නිසා ය.
3. ඇමරිකාවේ ගායකයෙකු නිසා ය.
4. ඇමරිකාවේ චිත්‍රපටයක් නිසා ය.

7) සැහැල්ලු සෙල්ලම් බඩු අතර බෝනික්කා ඉතා ජනප්‍රිය නිර්මාණයකි. මෙය නිර්මාණය කරගැනීම සඳහා කපා ගත යුතු පතරොම් කැබලි ගණන වන්නේ,

1. 10 කි.    2. 12 කි.    3. 14 කි.    4. 16 කි.

8) රෙදි බෝනික්කා නිර්මාණයේදී කොණ්ඩය සැකසීම සඳහා ගනු ලබන වූල් විශේෂය වන්නේ,

1. ඇන්කර් වූල් ය.    2. රැබිට් වූල් ය.    3. ජම්බෝ වූල් ය.    4. ක්‍රෝචට් වූල් ය.

9) කැබලි රෙදි ආශ්‍රිත නිර්මාණයේදී රෙදි බෝනික්කාගේ නාසය හා කට හැඩ කිරීම සඳහා යොදා ගනු ලබන විසිතුරු මැහුම් ක්‍රම දෙක වන්නේ,

1. බ්ලැන්කට් මැස්ම හා නැට් මැස්මයි.
2. චාට් මැස්ම හා දම්වැල් මැස්මයි.
3. බ්ලැන්කට් මැස්ම හා චාට් මැස්මයි.
4. නැට් මැස්ම හා දම්වැල් මැස්මයි.

10) පතරොම අනුව කපාගත් බෝනික්කාගේ කොටස් එකිනෙකට සම්බන්ධ කිරීමේදී යොදා ගනු ලබන මැහුම් ක්‍රමය කුමක්ද?

1. පිස්මේන්තු මැස්ම
2. චාට් මැස්ම
3. බ්ලැන්කට් මැස්ම
4. නැට් මැස්ම

11) ටෙඩී බෙයාර් නිර්මාණයේදී අවසාන වශයෙන් සම්බන්ධ කර ගනු ලබන්නේ කුමන කොටසද?

1. කන් සහිත හිස කොටස
2. ඇස් හා මුඛය සහිත කොටස
3. අත් හා පාද සහිත කඳ කොටස
4. හිස හා කඳ කොටස

12) බෝනික්කා මැසීමේදී පළමුවෙන්ම මසා නිමකොට පිරවුම් ද්‍රව්‍ය පුරවා ගනු ලබන්නේ,

1. කඳ කොටස ය.
2. අත් කොටස් දෙක ය.
3. පාද කොටස් දෙක ය.
4. හිස කොටස ය.